| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය<br>උපදේශක චක්‍රලේඛය 2004/පුස/02(අ) (සංශෝධිත 2017) |
|---|

ප්‍රාදේශීය සංස්කෘතික මධ්‍යස්ථාන / විද්‍යා පීඨ / කාර්මික විද්‍යාලවල
" ජාතික කියවීමේ මාසය වැඩසටහන - ඔක්තෝබර්" ක්‍රියාත්මක කිරීම

## 01. හැඳින්වීම

2004 වසරේ සිට ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති අතර, 2017 වර්ෂයේ ඔක්තෝබර් මාසය වෙනුවෙන් කියවීම් ප්‍රවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන මෙන් සියලුම සංස්කෘතික මධ්‍යස්ථාන/විද්‍යා පීඨ/ කාර්මික විද්‍යාලවලින් ඉල්ලා සිටිනු ලැබේ. ජනතාවගේ සහ සිසුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමත්, පුස්තකාල සම්පත් හා සේවාවන් ප්‍රවර්ධනය කිරීමත් මෙම වැඩසටහන්වල අරමුණු විය යුතු වේ.

## 02. කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුව

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම සඳහා කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම සුදුසු ය. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම්, එම කමිටුව සහ පාඨක සමාජය එක්ව මෙම කටයුත්ත සිදු කළ හැකි ය. එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

- ආයතන ප්‍රධානියා හෝ නියෝජ්‍ය ප්‍රධාන - කමිටු සභාපති
- පුස්තකාලයාධිපති/භාරකරු - කමිටු ලේකම්
- විෂය භාර නිලධාරීන් දෙදෙනෙක්
- ආයතන ප්‍රධානියා විසින් නම් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙක් (ශිෂ්‍ය, ශිෂ්‍යාවන්)

## 03. ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන්

- බැනර්/උද්‍ධෘත පාඨ හා පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම (කියවීමේ අගය ගම්‍ය වන පරිදි)
- විශේෂ තරඟ පැවැත්වීම (රචනා, චිත්‍ර, කථික, විවාද, නාට්‍ය, ගායනා, අත් අකුරු)
- බිත්ති පුවත්පත්, සමරු කලාප, සඟරා එළිදැක්වීම
- පුස්තකාලය පිළිබඳව අත් පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීම (පාඨක අධ්‍යාපන වැඩසටහන්)
- පොත් ප්‍රදර්ශන පැවැත්වීම
- ශ්‍රමදාන /පුස්තකාල අලංකරණය ආදී කටයුතු සිදු කිරීම
- පරිගණක යන්ත්‍ර හා අන්තර්ජාල සම්බන්ධතා ලබා ගැනීම
- අරමුදල් රැස්කිරීම, පොත් මිලට ගැනීම හා පරිත්‍යාග ලබා ගැනීම, පරිත්‍යාග ලබාදීම වැනි කටයුතු හා උපකරණ අලුතින් ලබා ගැනීම
- නව සාමාජිකයන් බඳවා ගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම

- සම්මන්ත්‍රණ හා දේශන සංවිධානය කිරීම
- අන්තර්ජාලය හරහා තොරතුරු ගවේෂණයට හුරුකරවීමේ වැඩසටහන් පැවැත්වීම
- චිත්‍රපට, වීඩියෝ දර්ශන ආදී විවිධ විනෝදජනක වැඩසටහන් මඟින් කියවීමේ රුචිය වර්ධනය කරලීම
- කියවීම් කඳවුරු, කියවීමේ තරඟ සංවිධානය කිරීම
- පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණ වැඩසටහන් දියත් කිරීම
- ඉටු කරනු ලබන වැඩසටහන් පිළිබඳ තොරතුරු විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල පළ කිරීම (පුවත්පත්)
- කියවීමේ රුචිය, සාහිත්‍ය, ලේඛන කලාව, තොරතුරු තාක්ෂණය, කියවීමේ අගය වැනි මාතෘකා පිළිබඳ ලිපි විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යවල පළ කිරීම (ආචාර්ය මණ්ඩලයේ, පාඨකයින්ගේ සහ සිසුන්ගේ නිර්මාණ)
- කුසලතා ඇගයීම සඳහා ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයක් සංවිධානය කිරීම

## 04. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම කළ යුතු නොවේ. ඔබ ආයතනයේ පොදු අරමුදලින් කොටසක් ද, පුස්තකාල අරමුදලින් කොටසක් ද යෙදවීම ප්‍රමාණවත් වන අතර ප්‍රදේශයේ දානපතියන්ගෙන් හා ව්‍යාපාරිකයන්ගෙන් මූල්‍ය අනුග්‍රහය ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු වේ. මේ සඳහා ව්‍යාපෘති කමිටුව සම්බන්ධ කර ගත යුතුය.

## 05. ඇගයීම

පුස්තකාලවලින් සිදු කරන ලද වැඩසටහන් පිළිබඳ වාර්තාවක්, ඡායාරූප/සංයුක්ත තැටි හා වෙනත් සාධක සහිතව ***2018 ජනවාරි මස 31*** වන දිනට පෙර ලැබෙන සේ පුස්තකාල භාර නිලධාරීන් විසින් සකස් කොට තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ***අංශ ප්‍රධාන, ව්‍යාපෘති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07 යන ලිපිනයට*** යොමු කළ යුතුය.

ජාතික කියවීමේ මාසයේ ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2018 ජාතික කියවීමේ මාසයේ රාජ්‍ය උත්සවයේ දී ත්‍යාග, සහතිකපත් හා සම්මාන පිරිනමනු ලැබේ.

ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ
සභාපති

**ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ**
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07.

විමසීම් - දුරකථන අංකය - 011-2698847, ෆැක්ස් 011-2674387, වෙබ් අඩවිය - www.natlib.lk